රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2023 (I)

මගේ අංකය : MPA/IAD/ADM/GA19/OTHER
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.05.17

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රධානීන් වෙත

**ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2023.05.14 දිනැතිව නිකුත් කරන ලද 08/2023 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ "04 වන ඡේදය" මුද්‍රණ දෝෂයක් හේතුවෙන්, එය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

> රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 මඟින් ක්‍රියා කිරීමට නියෝග කරන ලද යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක වීම මෙම අමාත්‍යාංශය මඟින් නියාමනයට ලක් කිරීම සිදු කරන අතර, ඒ සඳහා 2022.06.30 දින සිට 2022.12.31 දක්වා මාස 06 ක ජලය, විදුලිය, ඉන්ධන, දුරකථන පරිභෝජනය පිළිබඳ දත්ත වාර්තාවක් (මාසික ඒකක ගණන) 2023.06.30 දිනට පෙර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කළ යුතු ය. (අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු සහ ආයතනවල තොරතුරු මීට ඇතුළත් විය යුතු ය.) ඉන් පසු ඉහත ආකාරයටම විදුලිය, ජලය, ඉන්ධන හා දුරකථන වෙනුවෙන් භාවිතා කරන ලද මාසික ඒකක ගණන ඇතුලත් තොරතුරු වාර්තාවක් කාර්තුමය වශයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට එවීමට කටයුතු කළ යුතු ය.

02. මේ සම්බන්ධයෙන් සිදු වූ අපහසුතාවය පිළිබඳව කණගාටු වෙමි.

කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

දුරකථන අංකය :- 0112-692633
ෆැක්ස් අංකය :- 0112-697299
විද්‍යුත් ලිපිනය :- sas-ia@pubad.gov.lk